# සාධාරණ සමාජයක් ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රතිසංස්කරණ

**මැතිවරණ වර්ෂයක් වීම නිසාම මේ වසරේ ජනතාවගේ මැතිවරණ පිළිබඳ උණුසුම වසර ආරම්භයේ සිටම ඉහළ ගොස් තිබේ. මේ දිනවල ජනාධිපතිවරණය පිළිබඳව මෙන්ම විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම, නව මැතිවරණ ක්‍රම සම්බන්ධයෙන්ද විවිධ අදහස් යෝජනා හුවමාරු වෙමින් තිබේ.**

සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරයද ඔවුන්ගේ මැතිවරණ ප්‍රතිසංස්කරණ යෝජනාවලිය පසුගියද ඉදිරිපත් කළේය. සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරයද ආරම්භයේ සිටම විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම වෙනුවෙන් පෙනී සිටින අතර මෙවර ඔවුන් යෝජනා කර ඇති මැතිවරණ ප්‍රතිසංස්කරණ තුළ "මිශ්‍ර බහු මන්ත්‍රී සමානුපාතික ක්‍රමය" නමින් නව මැතිවරණ ක්‍රමයක්ද යෝජනා කර ඇත.

කෙසේවෙතත් මේවනවිට විධායක ජනාධිපති ධුරය අහෝසිකිරීමක් වෙනුවෙන් සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරය ආරම්භයේ සිටම කටයුතු කළ බවද ඉදිරියටත් ඒවෙනුවෙන් පෙනී සිටින බවද මෙම යෝජනාවලිය ප්‍රසිද්ධ කරමින් එහි සභාපති හිටපු කථානායක කරු ජයසූරිය මහතා පැවසීය. ජනාධිපතිවරණයක් ආසන්නයේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට තම සංවිධානය යෝජනා නොකරන බවත් ජනාධිපතිවරණය පවත්වා ඉන් අනතුරුව විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට සුදුසු බව යෝජනා කරන බවද කරු ජයසූරිය මහතා එහිදී ප්‍රකාශ කළේය.

සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරයද ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රතිසංස්කරණ යෝජනාවලිය දෙස අවධානය යොමුකිරීමේදී ඔවුන් ඉහළ අධිකාරියක් විසින් සිදුකළ යුත්තේ පහළ අධිකාරියකින් සිදුකළ නොහැකි කාර්යයන් පමණක් යන මූලධර්මය (සබ්සිඩියැරිටි මූලධර්මය) මත සිටිමින් ඒඅනුව සකස් කරන මැතිවරණ ක්‍රමයක් විශ්වාසකරන බව සඳහන් කර තිබේ.

මෙම යෝජනාවලිය2010 වසරේදී පාර්ලිමේන්තුවේ සර්ව පාක්ෂික නියෝජිත කමිටු වාර්තාව, 2023 නීතියේ ආධිපත්‍ය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ කමිටු වාර්තාවන් තුළ ඇතුළත් යෝජනා සමගද සමපාත වන අතර ඔවුන් විසින් හඳුනාගත් අලුත් යෝජනාද ඉදිරිපත් කර තිබේ.

ආණ්ඩුව දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන මට්ටම් තුන ජාතික පළාත් ප්‍රාදේශීය මට්ටම් පිළිගනිමින් ප්‍රාදේශීය මට්ටමේ අධීක්ෂණ ක්‍රියාවලිය සාර්ථක කිරීම සඳහා ග්‍රාම නිලධාරී කොට්ඨාස, ජන සභා සහ අනිවාර්ය පුරවැසි සහභාගීත්වය සහිත ප්‍රාදේශීය සභාවල ස්ථාවර කමිටු ක්‍රියාත්මක විය යුතු බව ඔවුන්ගේ යෝජනාවලිය තුළ ඇතුළත් කර තිබේ.

පළාත් පාලන ආයතන අතර වඩා හොඳ සම්බන්ධීකරණය සහ සහයෝගීතාව සහ පළාත් සභා මගින් වඩාත් ඵලදායි අධීක්ෂණය සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පිහිටුවීම කළ යුතු බව යෝජනා කර ඇත.

ජාතික මට්ටමේදී විධායක ජනාධිපති ධුරය අහෝසි කර පාර්ලිමේන්තුවෙන් පත්වන ජනාධිපතිවරයකු සහ අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයකින් රට පාලනය කළ යුතු බවට සඳහන් කර තිබේ.

එමෙන්ම පාර්ලිමේන්තුවට අමතරව දෙවන සභා ගර්භයක් යෝජනා කර ඇති අතර පළාත් සභා නියෝජනය කරන පුද්ගලයින් 45 කු ඒ සඳහා පත්කළ යුතු බවට යෝජනා කර තිබේ.

පනත් කෙටුම්පත් සම්මත කිරීමට පෙර දෙවැනි සභා ගර්භයට යොමුකිරීම, ජාතික ප්‍රතිපත්ති හෝ ප්‍රමිති සැකසීමට පෙර එම යෝජනා දෙවැනි සභා ගර්භයේදී අනුමත කළ යුතු බවටද යෝජනා කර තිබේ.

මෙම යෝජනාවලියේ හඳුන්වාදී ඇති මිශ්‍ර බහු මන්ත්‍රී සමානුපාත ක්‍රමය පාර්ලිමේන්තුව සහ පළාත් සභා සඳහා යොදාගැනීමට හැකි බව ඔවුන් උදාහරණ සහිතව පෙන්වා තිබේ. විශේෂයෙන්ම මෙහිදී කේවල ආසන ක්‍රමය 40% දක්වා අඩුකිරීමට හැකියාව ඇති බවත් පාර්ලිමේන්තු ආසන සංඛ්‍යාව වන 225 ක් ලෙසම පවත්වාගෙන යාහැකි බව පෙන්වා දී තිබේ. එමෙන්ම දිස්ත්‍රික් සමානුපාත ක්‍රමය තුළ ද්විත්ව මන්ත්‍රී කලාප සහ ත්‍රිත්ව මන්ත්‍රී කලාප ඇති කළ යුතු බවට යෝජනා කර තිබෙන අතර එම කලාප 80 ක් පෙන්වාදී තිබේ. මේ හරහා අපේක්ෂකයින්ගේ තරග කිරීම එම කලාප වලට පමණක් සීමා වන අතර ජනතාවට ඍජුව වගකියන නියෝජිතයන් දෙදෙනෙක් හෝ තිදෙනෙක් අදාළ කලාප වලින් බිහිවන පත්කරගත හැකි බව යෝජනාවලිය තුළ උදහරණ සහිතව දක්වා ඇත.

මෙම ක්‍රමයට යාමේදී ඡන්ද පත්‍රිකාවේ වෙනසක් කළ යුතු බවත් කලාප සඳහා නාම යෝජනා ලබාගැනීමේදී පක්ෂ අතර ආසන බෙදා දීමේදී යම් යම් වෙනස්කම් කිහිපයක් අවශ්‍ය බවත් යෝජනා කර තිබේ.

එමෙන්ම කාන්තා සහ තරුණ නියෝජනය පිළිබඳ අවධානය යොමුකරමින් මෙම ප්‍රතිසංස්කරණ සකස්කර තිබීමද වැදගත් කරුණකි. ප්‍රාදේශීය මට්ටමේදී තරුණ සහ කාන්තා නියෝජනය සඳහා වැඩි අවධානයක් දී ඇත. ඊට අමතරව පාර්ලිමේන්තු හා පළාත් සභා මැතිවරණ වලදී යම් පක්ෂයක් ජාතික ලැයිස්තුවෙන් තෝරා පත්කරගන්නා මන්ත්‍රීන් සෑම තුන්දෙනගෙන් එක් අයෙක් කාන්තාවක් විය යුතු බවද යෝජනා කරතිබේ.

මෙම යෝජනාවලිය අනුව ජනසභා කමිටු, කොට්ඨාස කමිටු තුළ ප්‍රජා දායකත්වය උපරිම මට්ටමට පවතී. ප්‍රාදේශීය පළාත් ආයතන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු, පළාත් සභා, පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා සහ පාර්ලිමේන්තුව තුළ පුරවැසි දායකත්වය යම් යම් ආකාරයෙන් විග්‍රහකර තිබේ.

ශ්‍රී ලංකාවේ පවතින මැතිවරණ ක්‍රමය වෙනුවට නව මැතිවරණ ක්‍රමයක් සකස්විය යුතු බව මේ වනවිට බොහෝදෙනා පිළිගන්නා කරුණක් මෙන්ම බොහෝදෙනා කතාබහ වන කරුණක් බවට පත්ව තිබේ. මේ ආකාරයට මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් නිරවුල් භාවයක් ඇතිකරගැනීමෙන් පසුව කල්දමා ඇති පළාත් සභා මැතිවරණයද, පළාත් පාලන මැතිවරණයද පැවැත්වීමට හැකි වනු ඇත. මැතිවරණ ක්‍රම ප්‍රතිසංස්කරණයේදී පාර්ලිමේන්තුවේ කාර්යභාරය ඉතා ඉහළ බැවින් රටට සුදුසු මැතිවරණ ක්‍රමයක් පාර්ලිමේන්තුව හරහා සකස් කරගැනීමට පුරවැසියන් මෙන්ම සිවිල් ප්‍රජාවේද දායකත්වය නොඅඩුව ලැබිය යුතු කාලය එළැඹ තිබේ.

■ චාමර සම්පත්